EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவு சங்கம்
Education Co-operative Society

# තනතුරු පුරප්පාඩු

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමුපකාර සමිතියකි.

සමිතියේ ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා කාර්යාලවල පවතින මතු සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා සමිතියේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් සහ බාහිර අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත සඳහන් පොදු කොන්දේසිවලට අදාළව සකසන ලද අයදුම්පත්‍ර 2026-04-04 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතුය.

(යාපනය, මන්නාරම දිස්ත්‍රික් හැර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල ප්‍රධාන නගරයන්හි සමිතියේ ශාඛා කාර්යාල පවතී.)

මේ සඳහා කුසලතා පූර්ණ, උද්යෝගිමත් හා කැපවීමෙන් යුතුව වැඩකිරීමේ හැකියාව ඇති සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## සහකාර ගණකාධිකාරී (විධායක සේවා අංශය E.3.2 - III - ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ/ මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය යන ක්ෂේත්‍රයේ උපාධිය සමඟ ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02 ක පළපුරුද්ද

**හෝ**

2. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ වසර 04 ක ඩිප්ලෝමා පාඨමාලාව සමඟ ගිණුම්කරණ / වාණිජ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02 ක පළපුරුද්ද

**හෝ**

3. වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ දෙවන අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

4. ගණකාධිකරණ ශිල්පී ආයතනයේ (AAT) තුන්වන අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

5. ඉහත 1,2,3 හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමුපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර 07 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

**වැටුප් පරිමාණය :** මාසික 48,400 - 720 X 10

**පොදු කොන්දේසි**

- අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 නොඉක්මවිය යුතු අතර, සමුපකාර සමිතියක සේවයේ නියුතුව සිටින අයෙකුනම් උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
- ඉහත සඳහන් තනතුරට අදාළ මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාවද, රජය විසින් අනුමත රු.11,000/- දීමනාවද හිමි වනු ඇත.
- මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම්ලාභියෙකු සඳහා සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් වැටුපෙන් 10% ක් ගෙවිය යුතු අතර, ආයතනයෙන් 15% ක් බැර කෙරෙනු ඇත.
- අයදුම්කරුවන් ජීව දත්ත සහ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇතුළත්ව තමා විසින්ම සකස් කරගත් ජීව දත්ත පත්‍රිකාවක් සමඟ ලබා දී ඇති අයදුම්පත්‍ර ආකෘතියද සම්පූර්ණ කර ඉල්ලුම් කළ යුතුය.

**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය**

**තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................
2. මුලකුරු සමඟ නම : ..................................................
3. ස්ථිර ලිපිනය : ..................................................
4. උපන් දිනය : .................. වයස අවු. .................. මාස .................. දින ..................
5. ජාතික හැඳුනුම්පත් අංකය : ..................
6. ස්ත්‍රී/ පුරුෂ භාවය : .................. 7. විවාහක/ අවිවාහක බව : ..................
8. දුරකථන අංකය : .................. 9. Whatsapp අංක : ..................
10. ඉල්ලුම් කරන මූලික සුදුසුකම් : ..................................................

..................................................

..................................................

..................................................

..................................................

..................................................

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර, මා පහත සඳහන් කරුණු සඳහා එකඟව මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන බව සහතික කරමි.

- දිවයිනේ ඕනෑම ශාඛා කාර්යාලයක සේවය කිරීමට එකඟ වෙමි.
- තනතුර සඳහා තෝරාගත් පසු ස්ථානගත කිරීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සිදුකරන බව මා හොඳින් දන්නා බවත්, ඒ මත කරනු ලබන සේවා ස්ථානගත කිරීම් සඳහා මාගේ එකඟතාවය මෙයින් පළකරමි.

..................................... .....................................

**දිනය** **අත්සන**

**ජා. හැ. අංකය :** .....................................

**නම :** .....................................

- අයදුම්කරුවන්ගේ ජීවදත්ත පත්‍රිකාව සමඟ අයදුම්කරුවන් තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතිකවල ඡායා පිටපත් ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද තමා විසින්ම සහතික කර එවිය යුතුය.
- අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.
- වෙනත් සමුපකාර සමිතියක සේවය කරන අයකු අයදුම්පත් එවීමේදී අදාළ සමිතිය මගින් ඉදිරිපත් කළ යුතු අතර, වෙනත් සමුපකාර සමිතියක සේවය කරන අතරතුර ඍජුව අයදුම්පත් එවා ඇති බැව් ඔහු/ ඇය තෝරා ගත් පසුව වුවද අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වනු ඇත.
- සමිතියේ ඕනෑම ශාඛා කාර්යාලයක සේවය කිරීමට කැමති විය යුතු අතර, තෝරා ගැනීමෙන් පසු පුරප්පාඩු පවතින කාර්යාල වෙත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි අනුයුක්ත කිරීම සිදුකරන බැවින් ඒ සඳහා එකඟවිය යුතුය.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
- සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2025/03 සහ 2025/04 යන චක්‍රලේඛ ප්‍රකාරව මෙම බඳවා ගැනීම් සිදුකරනු ඇත.

**ප්‍රධාන සභාපති,**
**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර, කොළඹ 03.**
**දුරකථන අංකය :- 011-2266000**